# ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

## ජාතික යොවුන් සේනාංකය

# ඇබෑර්තු

ජාතික යොවුන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

# ස්ථිර පදනම මත බඳවා ගන්නා තනතුරු

01. අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මුල්‍ය) (HM 1-1)
02. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (MM 1-1)
03. සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (MM 1-1)
04. සභා ලේකම් / නීති නිලධාරී (MM 1-1)
05. පරිපාලන නිලධාරී (මානව සම්පත්) (JM 1-1)
06. ප්‍රසම්පාදන නිලධාරී (JM 1-1)
07. කාර්මික නිලධාරී (JM 1-1)
08. සංවර්ධන සහකාර (M 3)
09. කළමනාකරණ සහකාර (MA 1-1)
10. දෙමළ භාෂා පරිවර්තක (MA 1-1)
11. සෞන්දර්ය උපදේශක (MA 1-1)
12. උපදේශක (දෙමළ) (MA 1-1)
13. උපදේශක (තොරතුරු තාක්ෂණ) (MA 1-1)
14. උපදේශක (ඉංග්‍රීසි) (MA 1-1)

මෙම තනතුරු ස්ථිරය, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

**කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු**

15. මධ්‍යස්ථානාධිපති (JM 1-1 Fixed)
16. සහාය මධ්‍යස්ථානාධිපති (JM 1-1 Fixed)
17. උපදේශක (සරඹ) (MA 1-1 Fixed)

මෙම තනතුරු සඳහා අවුරුදු 03 ක උපරිම කාලයකට යටත්ව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

**මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවකුම**

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**ස්ථිර පදනම මත බඳවා ගන්නා තනතුරු**

## 01. අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මුල්‍ය) (HM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් සමග පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබාතිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් සහිතව දිවයිනාප්ත සේවයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ජාතික යෞවන සේනාංකයේ කළමනාකාර (MM) සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : HM 1-1 - 2/2016 :- රු. 81,670- 15X2,270 - රු.115,720 මිට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

## 02. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (MM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : MM 1-1 - 2/2016 රු. - 53,175 - 10X1,375 -15X1,910 = රු. 95,575 මිට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

## 03. සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (MM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : MM 1-1 - 2/2016 :- රු. 53,175 - 10X1,375 -15X1,910 = රු. 95,575 මිට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

## 04. සභා ලේකම් / නීති නිලධාරී (MM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයකු ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර (JM 1-1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : MM 1-1 - 2/2016 - රු. 53,175 - 10X1,375 -15X1,910 = රු. 95,575 මිට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

## 05. පරිපාලන නිලධාරී (මානව සම්පත්) (JM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. Institute of Professional Management (IPM) හි Professional Qualification of in Human Resource Management (PQHRM) සුදුසුකම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර _ (තාක්ෂණ නොවන) (MA 1-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : JM 1-1 - 2/2016 :රු. 42,600 - 10X755 -18X1,135 = රු. 70,580 මිට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප්

ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

## 06. ප්‍රසම්පාදන නිලධාරී (JM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් :** **බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

   සහ

   සුදුසුකම ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - (තාක්ෂණ නොවන) (MA 1-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය :** JM 1-1 - 2/2016 රු. 42,600 - 10X755 -18X1,135 = රු. 70,580 මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

## 07. කාර්මික නිලධාරී (JM 1-1)

**අධ්‍යාපන සුදුසුකම් :** **බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5 )**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී (සිවිල්) ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

5. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය :** JM 1-1 - 2/2016 රු. 42,600 - 10X755 -18X 1,135 = රු. 70,580 මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

සමත්ව තිබීම.

සහ

ආ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03)ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

සහ

ඈ. රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ඉංග්‍රීසි භාෂා විෂය ඉගැන්වීම පිළිබඳව මාස හය (06) කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන** : ඉංග්‍රීසි භාෂා විෂයයක් සහිතව උපාධියක් ලබා ඇති අයට ඉහත (අ), (ආ), (ඇ) සහ (ඈ) සුදුසුකම් අවශ්‍ය නොවේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අ. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත (ආ), (ඇ), (ඈ) සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මෙ සඳහා අයදුම් කළ හැකිය.

ආ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

ඈ. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

ඉ. නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : MA 1-1 - 2/2016 : රු. 27,910 - 10X300- 7x350 -4x495-20X660 රු. 48,540/= මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. එසේම වසර 2020 දක්වා වැටුප් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන II අනුව වේ.

**කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු**

## 15. මධ්‍යස්ථානාධිපති

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 06 කින් වත් සමත් විය යුතුය.

**පළපුරුද්ද** : ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර් නිලයක් හෝ ඊට නොඅඩු ත්‍රිවිධ හමුදාවේ නිලයක අවුරුදු 03 කට නොඅඩු සේවා කාලයක් සහිත විධිමත්ව විශ්‍රාම ලැබූ හෝ විධිමත් පරිදි ඉල්ලා අස් වී තිබිය යුතුය.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 නොඉක්ම විය යුතුය.

**පාරිශ්‍රමිකය** : රු. 33,770/= +860/= + 7800/= 42,430/= පාරිශ්‍රමිකයක් හිමි වේ. එමෙන්ම ඔබ විශ්‍රාමිකයකු නම් ඔබට හිමි වන්නේ ජීවන වියදම් දීමනාවෙන් අර්ධයක් පමණි.

(කොන්ත්‍රාත් කාලසීමාව තුළ වසරින් වසර සේවය දීර්ඝ කිරීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි මෙම පාරිශ්‍රමිකය සංශෝධනය වේ.)

## 16. සහය මධ්‍යස්ථානාධිපති

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් 06 කින් වත් සමත් විය යුතුය.

**පළපුරුද්ද** : ශ්‍රී ලංකා යුධ හමුදාවේ කපිතාන් නිලයක් හෝ ඊට නොඅඩු ත්‍රිවිධ හමුදාවේ නිලයක අවුරුදු 03 කට නොඅඩු සේවා කාලයක් සහිත විධිමත්ව විශ්‍රාම ලැබූ හෝ විධිමත් පරිදි ඉල්ලා අස් වී තිබිය යුතුය.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 නොඉක්ම විය යුතුය.

**පාරිශ්‍රමිකය** : රු. 33,770/= +860/= + 7800/= = 42,430/= පාරිශ්‍රමිකයක් හිමි වේ. එමෙන්ම ඔබ විශ්‍රාමිකයකු නම් ඔබට හිමි වන්නේ ජීවන වියදම් දීමනාවෙන් අර්ධයක් පමණි.

(කොන්ත්‍රාත් කාලසීමාව තුළ වසරින් වසර සේවය දීර්ඝ කිරීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි මෙම පාරිශ්‍රමිකය සංශෝධනය වේ.)

## 17. උපදේශක (සරඹ)

**සුදුසුකම්** : 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම.

සහ

ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලයකට නොඅඩු නිලයක් දරා තිබීම.

සහ

හමුදා සරඹ උපදේශක පාඨමාලාව සාර්ථකව හදාරා තිබීම හෝ යුද, ගුවන් හෝ නාවික හමුදාවක බටහිර තූර්ය වාදක කණ්ඩායමක සාමාජිකයකු වී තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 නොඉක්ම විය යුතුය.

**පාරිශ්‍රමිකය** : රු. 22,126/= +4,092/= + 7800/= = 34,018/= පාරිශ්‍රමිකයක් හිමි වේ. එමෙන්ම ඔබ විශ්‍රාමිකයකු නම් ඔබට හිමි වන්නේ ජීවන වියදම් දීමනාවෙන් අර්ධයක් පමණි.

(කොන්ත්‍රාත් කාලසීමාව තුළ වසරින් වසර සේවය දීර්ඝ කිරීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි මෙම පාරිශ්‍රමිකය සංශෝධනය වේ.)

මෙම තනතුරු සඳහා අයදුම්කරන්නන් සුදුසු ආකෘතියක් අනුව ඉල්ලුම්පත්‍රයක් පිළියෙල කොට ඉල්ලුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කර අදාළ සහතිකවල ඡායා පිටපත් සමගින් 2018.06.01 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

**අධ්‍යක්ෂ,**
**ජාතික යොවුන් සේනාංක මූලස්ථානය,**
**අංක 420, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

**අධ්‍යක්ෂ**
**ජාතික යොවුන් සේනාංකය,**
**2018.05.18**